# ජන හා නිවාස සංගණනය

## ගණන් ගැනීමේ අදියර 2012 පෙබරවාරි - මාර්තු

## මාධ්‍ය නිවේදනය

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාවේ 14 වන ජන හා නිවාස සංගණනය ප්‍රධාන පියවර 3ක් යටතේ සංවිධානය කරන ලදි. මෙහි පළමු අදියර වන ශ්‍රී ලංකාවේ සියළු ග්‍රාම නිලධාරී වසම් සිතියම් ගත කිරීම හා දෙවන අදියර වන සියළු ගොඩනැගිලි ඒකක ලැයිස්තුගත කිරීම මේ වන විට අවසන් කර ඇත. ජන හා නිවාස සංගණනයේ ගණන් ගැනීමේ අදියර කොටස් 2 කින් පැවැත්වේ. සියළුම පුද්ගලයන්ගේ හා ඔවුන් පදිංචි ස්ථානවල තොරතුරු රැස් කිරීම පෙබරවාරි 27 සිට මාර්තු 19 දක්වා වූ සති තුනක කාලය තුල සිදු කෙරේ. ඉන් අනතුරුව මාර්තු 20 හා 21 දිනවලදී තොරතුරු රැස්කිරීමේ දින සිට ඒ දක්වා සිදු වූ උපත් හා මරණ පදනම් කරගෙන සිදු කල යුතු සංශෝධන ඇතොත් ඒවා සිදු කෙරේ. ඊට අමතරව  මාර්තු 19 දින රාත්‍රියේ දී පදිංචි ස්ථානයක් නොමැති හා එළිමහනේ ජීවත්වන පුද්ගලයන් ගණන් ගැනීම සිදු කිරීමට නියමිතය.

සංගණන ආඥා පනත අනුව ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් සංගණන අධිකාරි ලෙස සංගණනය මෙහෙයවීම සිදුකරන අතර දිස්ත්‍රික් ලේකම්වරු සංගණන කොමසාරිස්වරු ලෙසද, ප්‍රාදේශීය ලේකම්වරු නියෝජ්‍ය සංගණන කොමසාරිස්වරු ලෙසද, සහකාර  ප්‍රාදේශීය ලේකම්වරුන් සහකාර සංගණන කොමසාරිස්වරු ලෙසද ජන හා නිවාස සංගණනයේ ක්ෂේත්‍ර පරිපාලන කටයුතු පිලිබඳ වගකීම දරනු  ලබයි. ගෙයින් ගෙට ගොස් තොරතුරු එක්රැස් කිරීම සඳහා ගණන් ගන්නා නිලධාරින් 80,000 ක් පමණ කෙටි කාල සීමාවක් සඳහා තෝරා ගෙන ඇත. ඔවුන්ගේ අධීක්ෂණ නිලධාරින් ලෙස ග්‍රාම නිලධාරින් ඇතුළු රජයේ නිලධාරින් 16,000 ක් පමණ පත් කර ඇත. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරුන් හා නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය සංගණන අධිකාරීවරුන් ලෙසද ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ/ සංඛ්‍යාලේඛනඥවරුන් සහකාර සංගණන අධිකාරීවරුන් ලෙසද සංඛ්‍යාලේඛන නිලධාරීන් හා සංඛ්‍යාලේඛන සහකාරවරුන් ප්‍රාදේශීය සංගණන නිලධාරීන් ලෙසද ජන හා නිවාස සංගණනයේ තාක්ෂණික කටයුතු ද, අනෙකුත් පරිපාලන සම්බන්ධීකරණ කටයුතු ද සිදු කරනු ලබයි.

ජන හා නිවාස සංගණනයේ ගණන් ගැනීමේ අදියරේදී දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ දැනටමත් පවත්වා අවසන් කර ඇත. අධීක්ෂණ නිලධාරීන් වන ග්‍රාම නිලධාරීන් පුහුණු කිරීම ජනවාරි 12 සිට ද ගණන් ගන්නා නිලධාරීන් පුහුණු කිරීම ජනවාරි 19 දා සිට ද දිවයින පුරා ආරම්භවේ.

වසර 30කට පසුව මුළු ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි පැවැත්වෙන මෙම ජන හා නිවාස සංගණනයේ ගණන් ගැනීමේ අදියරේදී නිවැරදි තොරතුරු ලබා දීමෙන් හා තමන් පදිංචි ස්ථානයකට පැමිණෙන ගණන් ගන්නා නිලධාරීන් හට අවශ්‍ය සහාය ලබා දීමෙන් මෙම වැදගත් ජාතික කර්තව්‍ය සාර්ථක කර ගැනීමට හැකිවේ.  එබැවින්  ජන හා නිවාස සංගණනයේ ගණන් ගැනීමේ අදියර සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ පදිංචි සියලුම පුද්ගලයින් දැනුවත් කිරීමේ සුවිශේෂී මෙහෙවර සියළුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය විසින් සිදු කරනු ඇතැයි ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව බලාපොරොත්තුවේ.